<u>බලපිටිය ප්‍රාදේශීය සභාව</u>
<u>ගාල්ල දිස්ත්‍රික්කය</u>

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට බලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
------------------------------------------------------------

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම රු. 286,274 කින් වැඩියෙන් ද වරෙන්තු ගාස්තු හා දඩ ආදායම රු.286,274 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.26,818,793 ක් සියලු වැඩසටහන් අතර විභජනය නොකර, එක් වැඩසටහනක් යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.7,337,002 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) රු.1,463,200 ක් වූ ට්‍රැක්ටරයේ වටිනාකම යන්ත්‍ර හා උපකරණ යටතේ ගිණුම්ගතකර තිබුණි.

1.3.4 **නොසැසඳු පාලන ගිණුම්**

-----------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.4,664,615 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.37,600,413 ක් වූ ගනුදෙනු සම්බන්ධව යාවත්කාලීන කරන ලද ණයගැති හා ණයහිමි ලේඛන, ශේෂ සනාථ සහතික, කාල විශ්ලේෂණ හා ශේෂ කරන ලද තැන්පත් ලේඛනය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,932,475 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 16,909,912 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **වරිපනම් බදු**

--------------

2013 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟ ශේෂය රු.13,589,347 ක් වූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 155 හා 158 විධිවිධාන ප්‍රකාර පියවර ගෙන හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.2 **බදුකුලී හා බලපත්‍ර ගාස්තු**

----------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අය කර ගත යුතුව තිබූ රු.567,291 ක් වූ බදු කුලී සහ රු.206,780 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥාපනතේ 155 හා 159 වගන්ති ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.540,493 ක උසාවි දඩ හා රු.48,868,394 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 **කඩකාමර බදුකුලී**

---------------------

**(අ) අහුංගල්ල පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදුදීම සම්බන්ධයෙන් 2014 පෙබරවාරි මාසයේදි සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

(i) විගණන පරීක්ෂණ අවස්ථාව වන විට හිඟ කඩ බදු කුලිය රු.261,287 ක් විය.

(ii) වෙළඳ සංකීර්ණයේ සිල්ලර කඩ කාමර 18 ක් සහ මාළු කඩ 04 ක් තිබුණ ද, ඒවායින් කඩ කාමර 14 ක් වසා දමා තිබූ අතර බදු දීමට අදාළ බදු ගිවිසුම්වල කාලය අවසන් වී තිබුණි.

(iii) සිල්ලඩ කඩ කාමර 11 කට අදාළ බදු ගිවිසුම් කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. පළාත් පාලන කොමසාරිස් විසින් 2012 දෙසැම්බර් 27 දින නිකුත් කරන ලද අංක : දපපා / පපාකො / 2010/01 දරන චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු අතර වසර 05 කට වරක් නව තක්සේරුවක් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) වෙළඳපොල ඉදිරිපිට ඇති මාර්ගයේ යොදා තිබෙන බෝක්කුව සහ කාණු පද්ධතිය මගින් ජලය ගලා නොබැසීම නිසා වැසි කාලයට කඩ කාමර ජලයෙන් යටවීමේ තත්ත්වයක් නිරීක්ෂණය විය. මේ හේතුව නිසා කඩ බදුකරුවන් නිසි පරිදි කඩ කුලී ගෙවීමට කටයුතු නොකිරීමත්, මාර්ගයට මුහුණලා නොතිබූ කඩ කාමර සඳහා ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීමත් හේතුවෙන් සභාවට ලබා ගතහැකි ආදායම් අහිමිවී ගොස් තිබුණි.

**(ආ) බලපිටිය පොදු වෙළඳපොල සම්බන්ධයෙන් 2014 පෙබරවාරි මාසයේදි සිදුකළ විගණන පරික්ෂාවේදි පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.**

(i) 2014 පෙබරවාරි මාසය වන විට කඩ කාමර 28 කින් සභාවට ලැබිය යුතු හිඟ බදු මුදල රු.854,115 ක් විය.

(ii) පළාත් පාලන කොමසාරිස් විසින් 2012 දෙසැම්බර් 27 දින නිකුත් කරන ලද අංක : 2010/01 දරන චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු අතර වසර 05 කට වරක් නව තක්සේරුවක් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) විගණන පරික්ෂණ අවස්ථාව වන විට කඩ කාමර23 ක් වසා තිබූ බව නිරීක්ෂණය විය.

**2.3 අධිභාර**

--------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර **08** ක් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.178,610 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාපති ඇතුළු සියළුම සභිකයින් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දියයුතු වුවද, මන්ත්‍රීවරුන් 10 දෙනෙකු විසින් 2013 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි. එමෙන්ම 2012 වර්ෂය සඳහා මන්ත්‍රීවරුන් 07 දෙනෙකු හා 2011 වර්ෂය සඳහා මන්ත්‍රීවරුන් 07 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබූ බවද නිරීක්ෂණය විය.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) අහුන්ගල්ල මහජන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම**

-------------------------------------------------------

කර්මාන්තයෙහි ඉදිකිරීම් 1998 නොවැම්බර් මාසයේ දී ආරම්භ කර තිබුණු අතර 2002 අප්‍රේල් මාසය දක්වා රු.662,575 ක් වැයකර තිබුණි. 2002 වර්ෂය අවසන් වනවිට පළමු මහල සඳහා කොන්ක්‍රීට් තට්ටුව යොදා පළමු මහලේ බිත්ති පමණක් බැඳ තිබුණු අතර, ඉතිරි වැඩ නොකර ඉදිකිරීම් අතරමඟ නවතා තිබුණි. ගොඩනැගිල්ල වර්ෂ 12 ක් තිස්සේ දිරාපත් වෙමින් පවතින බවත් අවට ප්‍රදේශය ද වල් බිහිවී තිබූ බවත් 2014 පෙබරවාරි 10 දින සිදුකල ස්ථානීය පරික්ෂාවේදි නිරික්ෂණය විය.

**(ආ) අඹගහපිටිය පන්සල අසලින් ඇති අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම**

-------------------------------------------------------------------

කර්මාන්තය සඳහා සභාවේ තාක්ෂණ සේවා නිලධාරී විසින් රු.300,000 ක ඇස්තමේන්තුවක් සකස් කර දිස්ත්‍රික් ඉංජිනේරු විසින් 2011 ජුනි 11 දින අනුමත කර තිබුණි. 2012 සැප්තැම්බර් 27 දින ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතියක් සමග රු.300,000 ක ගිවිසුමකට එළඹ 2013 සැප්තැම්බර් 30 දින රු.258,926 ක් ගෙවා තිබුණි.

මෙම මාර්ගය සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරි සමග 2014 පෙබරවාරි 11 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මාර්ගයේ ඝනකම මි.මී.125 වෙනුවට මි.මී.100 ලෙස සකස් කිරීමට තාක්ෂණ නිලධාරීගේ අභිමතය පරිදි කටයුතු කර තිබූ අතර ඒ සඳහා පූර්ව අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ii) ඝණකම අඩුවීම හේතු කොටගෙන මාර්ගයට යම් හානියක් සිදු වුවහොත් එය යථා තත්ත්වයට පත් කිරීමට වැයවන වියදම් අදාළ තාක්ෂණ සේවා නිලධාරී හා කොන්ත්‍රාත්කාර ආයතනය විසින් 50% බැගින් දැරිය යුතුය යන කොන්දේසි මත ගෙවීම් සිදු කිරීමට 2013 මැයි 02 දින ඉංජිනේරු සහකාර විසින් නිර්දේශ කර දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් ගෙවීම් අනුමත කර තිබුණි

(iii) මාර්ගයේ ස්ථාන දෙකක කොන්ක්‍රීට් කැඩී තිබීම නිසා එම ස්ථානවලට නැවත කොන්ක්‍රීට් යොදා තිබූ බවත් පාර මැද අඩි 10 ක පමණ පිපිරීමක් සිදු වි ඇති බවත් ඇස්තමේන්තු ප්‍රකාරව මාර්ගය සකස් නොකිරීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබූ බවත් නිරීක්ෂණය විය.

**4. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය